# (ඇ) මුදල් සැපැයුම*

1961 නොවැම්බර් මාසයෙන් අවසන් වූ එකොළොස් මාසය තුළ දී මුදල් සැපැයුම රුපියල් කෝටි 4·23 කින් හෙවත් සියයට 3·5 කින් ඉහළ ගියේය. 1960 දෙළොස් මාසය තුළ දී මුදල් සැපයුම වැඩි වූයේ රුපියල් කෝටි 3·11 කින් හෙවත් සියයට 2·6 කිනි. මේ වැඩි වීම ඇති වූයේ 1960 දෙසැම්බර් මාසයේ දී රුපියල් කෝටි 120·89 ක්වූ මුදල් සැපැයුම 1961 නොවැම්බර් අවසානයේදී රුපියල් කෝටි 125 11 වීමෙනි. 1961 වර්ෂයේ මුල් භාග මාසය තුළ වර්ෂයේ ඉතිරි මාසවලදීට වඩා සැලකිය යුතු අන්දමින් මුදල් සැපැයුම උච්චාවචනයට ලක් විය. 1960 දෙසැම්බර් අවසානයේ දී රුපියල් කෝටි 120·89 ක්වූ මුදල් සැපයුම පෙබරවාරි මාසයේ දී රුපියල් කෝටි 119.34 ට පහළ වැටිණි. යළිත් 1961 අප්‍රේල් මාසයේ දී රුපියල් කෝටි 130.62 ට සීඝ්‍ර ලෙස ඉහළ ගියේ ය. එහෙත්, නැවත මැයි මාසයේ දී මුදල් සැපයුම රුපියල් කෝටි 121·91 දක්වා සීඝ්‍රයෙන් පහළ වැටිණි. ඊට පසු මාසවල දී මුදල් සැපැයුම නොකඩවා වැඩි වූයේ සැප්තැම්බර් මාසයේ දී රුපියල් කෝටි 126·14 ක් විය. සැප්තැම්බර් හා නොවැම්බර් අතර කාලය තුළ දී මුදල් සැපයුම රුපියල් කෝටි 1·0 කින් පමණ අඩු විය.

සංඛ්‍යා සටහන II—30

**මුදල් සැපැයුම**

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේ දී | 1957 | 1958 | 1959 | 1960 | 1961 | (1957 න් 1958 ට වූ) වෙනස % | (1958 න් 1959 ට වූ) වෙනස % | (1959 න් 1960 ට වූ) වෙනස % | (1960 න් 1961 ට වූ) වෙනස% |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. .. | 1,131 | 1,014 | 1,050 | 1,180 | 1,207 | —10·3 | + 3·6 | +12·4 | + 2·3 |
| පෙබරවාරි .. | 1,105 | 1,016 | 1,053 | 1,192 | 1,193 | — 8·1 | + 3·6 | +13·2 | + 0·1 |
| මාර්තු .. .. | 1,107 | 1,023 | 1,089 | 1,194 | 1,210 | — 7·6 | + 6·5 | + 9·6 | + 1·3 |
| අප්‍රේල් | 1'082 | 1,032 | 1,084 | 1,165 | 1,306 | — 4·6 | + 5·0 | + 7·5 | +12·1 |
| මැයි .. .. | 1,061 | 1,000 | 1,096 | 1,163 | 1,219 | — 5·7 | + 9·6 | + 6·1 | + 4·8 |
| ජූනි .. .. | 1,045 | 1,015 | 1,094 | 1,170 | 1,221 | — 2·9 | + 7·9 | + 6·9 | + 4·4 |
| ජූලි .. .. | 1,056 | 1,023 | 1,094 | 1,150 | 1,223 | — 3·1 | + 6·9 | + 5·1 | + 6·3 |
| අගෝස්තු .. | 1,024 | 1,022 | 1,095 | 1,161 | 1,231 | — 0·2 | + 7·1 | + 6·0 | + 6·0 |
| සැප්තැම්බර් .. | 1,046 | 1,072 | 1,128 | 1,181 | 1,261 | + 2·5 | + 5·2 | + 4·7 | + 6·8 |
| ඔක්තෝබර් .. | 1,052 | 1,085 | 1,153 | 1,212 | 1,248 | + 3·1 | + 6·3 | + 5·1 | + 3·0 |
| නොවැම්බර් .. | 1,049 | 1,070 | 1,170 | 1,219 | 1,251 | + 2·0 | + 9·3 | + 4·2 | + 2·6 |
| දෙසැම්බර් .. | 1,040 | 1,077 | 1,178 | 1,209 | ලනො | + 3·6 | + 9·4 | + 2·6 | ල: නො: |

සංඛ්‍යා – ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1961 මුල් මාස සතරේ දී, විශෙෂයෙන්ම, අප්‍රේල් මාසයේ දී මුදල් සැපයුම සීඝ්‍ර ලෙස ඉහළ යාමට වැඩි වශයෙන් ම හේතු වූයේ වෙළෙඳ බැංකු හා ඒවායේ සේවකයන් අතර ඇති වූ ආරවුලක් නිසා බැංකු සේවාවන් අවුල් වීමෙන් සංසරණයෙහි පවත්නා මුදල් වැඩිවීමය. බැංකු සේවාවන් යථා තත්ත්වයට පැමිණීමත් සමගම මුදල් සැපැයුම සීඝ්‍රයෙන් පහළ වැටිණි. 1961 දී මුදල් සැපයුම බෙහෙවින්ම වැඩි වූයේ මහජනයා වෙතැති මුදල් ප්‍රමාණය වැඩිවීමෙනි 1959 පිළිවෙළ මෙයටවෙනස් විය එම වර්ෂයේ දී මුදල් සැපයුම ප්‍රධාන වශයෙන් වැඩි වූයේ ඉල්ලුම් තැන්පතු හේතු කොට ගෙනය. 1960 දී මහජනයා වෙත තුබූ මුදල් ප්‍රමාණය කෝටි 59 53 ක් වූ අතර 1961 දී එය රුපියල් කෝටි 6.98 කින් රුපියල් කෝටි 66.51 තෙක් වැඩි විය. මෙම කාලය තුළ දී, ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 61.36 සිට රුපියල් කෝටි 58·61 දක්වා රුපියල් කෝටි 2·75 කින් පහළ වැටිණි.

* වෙනත් විධියකට සඳහන් කොට නොමැති හැම විටම මේ කොටසෙහි 1961 අවසානයට දක්වෙන සියලුම සංඛ්‍යා 1961 නොවැම්බර් මාසයට පැවැති සංඛ්‍යා වෙයි. දැනට පවත්නා බැංකු සේවක අර්බුදය නිසා 1961 දෙසැම්බර් මාසයේ සංඛ්‍යා ලබා ගැනීමට නොමැත.

සංඛ්‍යා සටහන II—31

## මුදල් සැපයුම් සැකැසුම

රුපියල් දශ ලක්ෂ

| කාල ච්ඡේදය අවසානයේදී | මහජනයා සතු නෝට්ටු හා කාසි | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි සියයට ගණන | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි සියයට ගණන | |
| 1953 | 335·3 | 40·6 | 491·5 | 59·4 | 826·8 |
| 1954 | 341·8 | 35·7 | 615·3 | 64·3 | 957·1 |
| 1955 | 384·5 | 35·8 | 688·4 | 64·2 | 1,072·9 |
| 1956 | 401·1 | 35 6 | 725·7 | 64·4 | 1,126·8 |
| 1957 | 434·9 | 41·8 | 605·2 | 58·2 | 1,040·1 |
| 1958 | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1,076·8 |
| 1959 | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1,177·7 |
| 1960 | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1,208·9 |
| 1961* | 665·1 | 53·2 | 586·1 | 46·8 | 1,251·1 |

*1961 නොවැම්බර් සංඛ්‍ය - ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

මුදල් සැපයුමෙහි වැඩි වූ ව්‍යවහාර මුදල් වලට ප්‍රධාන වශයෙන්ම ඇතුළත් වූයේ වැඩි වටිනාකමින් යුතු මුදල් නෝට්ටුය. වෙනත් වටිනාකම්වල මුදල් නෝට්ටු වැඩි වුවද, ප්‍රමාණානුකූලව බලනකල වැඩි වටිනාකම්වල මුදල් නෝට්ටු වැඩිවීම විශාලය. 1960 දෙසැම්බර් මාසයේ දී පැවැති රු. 2/-කේ නෝට්ටු ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් කෝටි 1·74 ක් විය. මෙය 1961 නොවැම්බර් වන විට රුපියල් කෝටි 1·76 කට වැඩි විය. රුපියල් කෝටි 1.75 ක වටිනාකමට වූ රුපියලේ නෝට්ටු ප්‍රමාණය රුපියල් කෝටි 1·82 කට ඉහළ ගියේය 1960 දෙසැම්බර් මාසයේ දී රුපියල් කෝටි 14:84 ක්වූ රු. 50/- නෝට්ටු ප්‍රමාණය 1961 නොවැම්බර් වන විට රුපියල් කෝටි 2·22 කින් රුපියල් කෝටි 17·06 තෙක් වැඩි විය. 1960 දෙසැම්බර් මාසයේ රුපියල් කෝටි 14·84 ක්වූ රු. 100/- නෝට්ටු ප්‍රමාණය 1961 නොවැම්බර් වනවිට රුපියල් කෝටි 19·8 තෙක් ඉහල යාමෙන් මේ කාලය තුළ රුපියල් 100/- නෝට්ටු ද රුපියල් කෝටි 4·96 කින් වැඩි විය. රු 5/ හා රු. 10/- නෝට්ටු ප්‍රමාණයෙහි සැලකිය යුතු වෙනසක් ඇති නොවිණි 1960 දෙසැම්බර් මාසයේ දී රුපියල් කෝටි 23·76 ක්වූ රුපියල් 10/- නෝට්ටු ප්‍රමාණය, 1961 නොවැම්බරයේ දී රුපියල් කෝටි 23·74 ක් වීමෙන් රුපියල් කෝටි 0·02 ක අඩු වීමෙක් ඇති විය. රු. 5/- නෝට්ටු ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් කෝටි 0·06 කින් අඩු වූයේ රුපියල් කෝටි 4·01 සිට රුපියල් කෝටි 3 ·95 කට පහළ වැටිණි.

මුළු මුදල් සැපයුමෙහි ව්‍යවහාර මුදල් අනුපාතය මෙසේ වැඩිවීම ගත වූ වර්ෂයේ දී පමණක් ඇති වූවක් නොවේ. 1945 සිට 1947 අතර කාලය තුළ දී මුළු මුදල් සැපයුමෙන් සියයට 40 කටත් වැඩි ප්‍රමාණයක් ව්‍යවහාර මුදලින් සමන්විත විය. 1949 සිට ව්‍යවහාර මුදල් නිකුතුව මුදල් සැපයුමේ අනුපාතයක් වශයෙන් පහළ වැටී ඇත. 1956 දී මුදල් සැපයුමෙන් සියයට 35·6 ක් ව්‍යවහාර මුදල් වූ අතර සියයට 64·4 ක් තැන්පතු විය. 1957 න් පසුව මුළු මුදල් සැපයුමට වූ ව්‍යවහාර මුදල් අනුපාතය තරමක් වේගයෙන් වැඩිවිය. 1956 දී සියයට 35·6 ක්වූ ව්‍යවහාර මුදල් අනුපාතය 1957 දීසියයට 41·8 ට ඉහළ ගියේය 1958 දී මෙය සියයට 49·2 දක්වා තවත් සියයට 7 .4 කින් වැඩි විය. ඉන්පසුව මුදල් සැපයුමට වූ ව්‍යවහාර මුදල් අනුපාත සාමාන්‍යය සියයට 48 කට වැඩියෙන් පැවතිණි.

බැංකු තැන්පතු ප්‍රමාණය අනුව බලනවිට මුදල් සැපයුමෙහි ව්‍යවහාර මුදල් ප්‍රමාණය වැඩිවීම ආර්ථික අතින් සැලකිය යුතු කරුණෙකි. මුදල් සැපයුමට ඇතුළත් ව්‍යවහාර මුදල් ප්‍රමාණය වැඩි වන විට තැන්පතු ස්වරූපයෙන් වෙළෙඳ බැංකු වෙතැති වත්කම් අඩු වන බැවින් එය බැංකු ගනුදෙනු ක්‍රමය කෙරෙහි අවාසි සහගත බලපෑමක් ඇති කරයි. ව්‍යවහාර මුදල් බැංකුවල තැන්පත් නොකොට ළඟ තබා ගැනීමෙන් රටේ බැංකු ගනුදෙනු අඩුවීමෙක් ද දක්වේ බැංකු ගනුදෙනු අඩු වී ඒ වැදගත්කමින් හීනවීමෙන් මුදල් ප්‍රතිපත්තියට රටේ ආර්ථික ක්‍රමය පාලනය කිරීමේ අවියක් වශයෙන් ඇති ශක්තිය අඩ පණ වෙයි.

මෑත වර්ෂ වල දීආදායම් වශයෙන් වැඩි වූ මුදල් සාමාන්‍ය වශයෙන් බැංකු පහසුකම් නොමැති ජන කොටස් වලට ද ලැබෙන සේ වඩා පුළුල් අන්දමින් සමාජය තුළ බෙදී ගියා විය හැකිය. තවද, සමහර බැංකුවල සාධාරණව හෝ නැතිව අයකිරීම් වැඩි නිසා සුළු ශෙෂ ඇති අය අතර බැංකුවිල මුදල් තැන්පත් කිරීම ප්‍රචලිත නොවූවා විය. හැකිය රුපියල් 100/- සහ රු. 50 /- නෝට්ටු ප්‍රමාණය වැඩි වීම් තමන් සතු මුදල් ප්‍රමාණය නෝට්ටුවලින් තබා ගැනීමේ ඇති කැමැත්ත පෙන්නුම් කරන්නකි. සාමාන්‍යයෙන් ව්‍යාපාර සම්බන්ධයෙන් පැවැති අවිනිශ්චිත තත්ත්වය බදු මඟ හැරීමේ චේතනාව මේ තත්ත්වය ඇතිවීමට හේතු වූවා විය හැකිය. තව ද බැංකු හර බද්ද නිසා චෙක්පත් වලින් ගනුදෙනු කරනවාට වඩා මුදලින් ගනුදෙනු කිරීමට පෙළඹුනා විය හැකිය.

මුදල් සැපයුම ප්‍රසාරණයෙහි ලා රජයේ මුදල් පරිහරණය ඉතා වැදගත් බලපෑමක් ඇති කරන බව පසුගිය වාර්ෂික වාර්තාවලින් පෙන්වා දෙන ලදී 1961 දී ද මුදල් සැපැයුමෙහි වෙනස් කිරීමෙහි ලා ප්‍රධාන වශයෙන් බලපෑ කරුණ මෙය විය. එහෙත් 1959/60 වර්ෂය හා සසඳන විට සමීක්ෂණයට භාජන වී ඇති වර්ෂයේ රජයේ මුදල් ගනුදෙනු නිසා උද්ගත වන ප්‍රසාරණාත්මක බලපෑම අඩුවේ යැයි අපේක්ෂා කරනු ලැබේ. 1961 මුල් එකොළොස් මාසයේ දී මහ බැංකුව සතු රජයේ හා රජය සහතික කළ සුරැකුම් පත් රුපියල් කෝටි 10 95 කින් වැඩි විය. කලින් වර්ෂයේදී වූ වැඩිවීම රුපියල් කෝටි 22·43 කි. වෙළෙඳ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ සුරැකුම් පත් මෙම කාලය තුළ දී රුපියල් කෝටි 2·72 කින් වැඩි විය. මෙය 1960 වැඩි වූයේ රුපියල් කෝටි ·06 කිනි. රජයට දෙන ලද මහ බැංකු ණය 1961 දී රුපියල් කෝටි 2.01 කින් වැඩි විය. 1960 දී මෙය වැඩි වූයේ රුපියල් කෝටි 2.19 කිනි. රජයට දෙනලද ණය ප්‍රමාණය වැඩිවීම නිසා 1960 දී මුදල් සැපයුමෙහි ඇති වූ ශුද්ධ ප්‍රසාරණය රුපියල් කෝටි 26.02 ක්වූ අතර 1961 දී රුපියල් 14.39 ක ශුද්ධ ප්‍රසාරණයක් ඇති විය.

කලින් වර්ෂයේ දී මෙන්ම 1961 දී ද ජාත්‍යන්තර ගනුදෙනු තත්වය මුදල් සැපයුම කෙරෙහි සංකෝචන බලපෑමක් ඇති කිරීමෙහි ලා ප්‍රධාන වශයෙන් ඉවහල් විය. 1961 දී විදේශීය වත්කම් 1960 දී තරම් පහළ වැටුනේ නොවේ. එම නිසා විදේශීය වත්කම් අඩුවීම හේතු කොට පසුගිය අවුරුද්දේ තරමට මුදල් සැපයුමෙහි අඩුවීමෙක් 1961 දී ඇති නොවිණි. II·32 සටහනින් දක්වෙන අයුරු 1956 න් පසු විදේශීය වත්කම් අඩුවීම නිසා මුදල් සැපයුමෙහි ඇති වූ සංකෝචනය අනෙක් හැම වර්ෂයකටම වඩා 1961 දී අඩු බව පැහැදිළිවෙයි. විදේශීය වත්කම් පහළ වැටීම නිසා මුදල් සැපයුමෙහි ඇති වූ සංකෝචන බලපෑම් 1959 දී රුපියල් කෝටි 19·5 ක් සහ 1960 දී රුපියල් කෝටි 17·02 ක් වූ අතර 1961දී එය රුපියල් කෝටි 7 07 ක් විය· ඉකුත් වර්ෂවලදී පහළ වැටුන ප්‍රමාණයටම විදේශීය වත්කම් තව දුරටත් පහළ වැටුනේ නම් සමහර විට මුදල් සැපයුමෙහි ප්‍රසාරණය රුපියල් කෝටි 4.23 කට බෙහෙවින් අඩු විය හැකිව තිබිණි. මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරන අනෙකුත් සාධක එසේම තිබිය දී උද්ගත වූ මේ තත්වයෙන් 1961 ජාත්‍යන්තර ගනුදෙනුවල වාසි සහගත ලෙස ඇති වූ දියුණුව පිළිබිඹු කරයි. 1961 දී ස්ථාවර තැන්පතු හා අනෙකුත් වගකීම් රුපියල් කෝටි 2.48 කින් වැඩි විය. 1960 දී මේ වැඩිවූයේ රුපියල් කෝටි 7 25 කිනි. 1961 දී රජයේ මුදල් විශේෂ රුපියල් කෝටි 1·29 කින් ඉහළ ගියේය. මෙම ශේෂයන් 1960 දී රුපියල් කෝටි 0.8 කින් ද 1959 දී රුපියල් කෝටි 6.4 කින් ද පහළ වැටී ඇත.

මුදල් සැපයුම වෙනස් කිරීමෙහිලා බලපෑ හේතූන් 1956 සිට තුලනාත්මකව පහත සටහනේ පිඹුකොට දක්වා ඇත.

සංඛ්‍යා සටහන II—32

## මුදල් සැපැයුමෙහි වෙනස්වීම්

රුපියල් දශ ලක්ෂ

| වෙනසට හේතු | 1956 - 57 දෙසැම්බර් අග දක්වා | | 1957 - 58 දෙසැම්බර් අග දක්වා | | 1958 - 59 දෙසැම්බර් අග දක්වා | | 1959 - 60 දෙසැම්බර් අග දක්වා | | 1960 - 61 නොවැම්බර් අග දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණ හේතු | සංකෝචන හේතු | ප්‍රසාරණ හේතු | සංකෝචන හේතු | ප්‍රසාරණ හේතු | සංකෝචන හේතු | ප්‍රසාරණ හේතු | සංකෝචන හේතු | ප්‍රසාරණ හේතු | සංකෝචන හේතු |
| 1 බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) .. | — | 209·2 | — | 82·2 | — | 195·0 | — | 170·2 | — | 70·7 |
| 2. වෙළෙඳ බැංකු ගණුදෙනු | | | | | | | | | | |
| (අ) පෞද්ගලික අංශයට දුන් ණය | 55·3 | — | 53·4 | — | 9·7 | — | 31·5 | — | — | 2·6 |
| (ආ) අනැතිභාණ්ඩාගාර බිල්පත් හා රජයේ හා රජය සහතික කළ ණය පත් .. | — | 7·4 | — | 39·6 | 30·2 | — | 6·0 | — | 27·2 | — |
| 3. මහ බැංකු ගණුදෙනු | | | | | | | | | | |
| (අ) රජයට දුන් ණය .. .. | 32·6 | — | 75·0 | — | 61·8 | — | 21·9 | — | 20·1 | — |
| (ආ) භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ සහ රජය සහතික කළ ණය පත් .. | 42·2 | — | 100·6 | — | 191·0 | — | 224·3 | — | 109·5 | — |
| (ඇ) අනෙකුත් වත්කම් හා ගිණුම් (ශුද්ධ) .. .. | — | 10·3 | 24·5 | — | — | 27·9 | — | 19·3 | — | 6·0 |
| 4. වෙළෙඳ බැංකුවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සහ අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | — | 38·4 | — | 68·1 | — | 23·2 | — | 72·5 | — | 24·8 |
| 5 රජය සතු ව්‍යවහාර මුදල් ශෙෂ .. | 49·3 | — | — | 36·4 | 64·0 | — | 8·0 | — | — | 12·9 |
| 6 ගැලපිලි .. .. | — | 0·8 | 9·6 | — | — | 9·6 | 1·4 | — | 2·5 | — |
| ප්‍රසාරණ/සංකෝචක එකතුව .. .. | 179·4 | 266·1 | 263·1 | 226·3 | 356·7 | 255·7 | 293·1 | 262·0 | 159·3 | 117·0 |
| මුදල් සැපැයුමෙහි වෙනස .. .. | — 86·7 | | + 36·6 | | + 101·0 | | + 31·1 | | + 42·3 | |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සංලක්ෂ්‍යය:- කලින් පළ කළ සංඛ්‍යාවනට වඩා වෙනස් වී ඇත්තේ පසුව කළ සංශොධන නිසාය